320

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

**බන්ධනාගාර මූලස්ථානයේ සහකාර බන්ධනාගාර අධිකාරී (පුනරුත්ථාපන/ පිරිමි) තනතුර සඳහා අභ්‍යන්තර බඳවා ගැනීම.**

බන්ධනාගාර මූලස්ථානයේ සහකාර බන්ධනාගාර අධිකාරී (පුනරුත්ථාපන/පිරිමි) තනතුරෙහි පවතින පුරප්පාඩු 02 අභ්‍යන්තර පදනමින් සම්පූර්ණ කිරීම සඳහා අංක 02 හි සඳහන් සුදුසුකම්ලත් දැනට සේවයේ නියුතු ප්‍රධාන පුනරුත්ථාපන නිලධාරීන්ගෙන් සහ පළමු පෙළ පුනරුත්ථාපන නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය :- ...2022.-11.-14

සටහන :- අයදුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

01. බඳවා ගැනීමේ ක්‍රමය

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව සහකාර බන්ධනාගාර අධිකාරී (පුනරුත්ථාපන/පිරිමි) තනතුරට බඳවා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු ලබා දීමේ පටිපාටියට අනුකූලව සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත්කරනු ලබන සංඛ්‍යාව සහ පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

02. අවශ්‍ය සුදුසුකම්

I. ඉල්ලුම්පත් කැඳවන දිනට වසර හයක සේවා කාලයක් ඇති පළමු පෙළ පුනරුත්ථාපන නිලධාරියෙකු හෝ ප්‍රධාන පුනරුත්ථාපන නිලධාරියෙකු වීම.

II. උසස්වීම් ලබාදීමේ දී වර්තමාන තනතුරේ සහ පූර්ව තනතුරුවල පූර්වාසන්න වසර පහක් තුළ දී සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

III. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුළ සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව දඬුවමක් ලබා නොතිබීම.

V. සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

CamScanner

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි

I. මෙම තනතුර සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රාජ්‍ය සේවයේ පත්වීම් සඳහා බලපාන පොදු කොන්දේසි මත, සහකාර බන්ධනාගාර අධිකාරී තනතුර සඳහා වූ බඳවා ගැනීමේ පටිපාටියෙහි කොන්දේසිවලට යටත් විය යුතුය.

II. මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තවද, වැන්දඹු හා අනත්දරු /වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් විය යුතුය. රජය මගින් විටින්විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

III. මෙම පත්වීම වසරක වැඩබැලීමේ කාලසීමාවකට යටත්ය. සහකාර බන්ධනාගාර අධිකාරී (පුනරුත්ථාපන) III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියෙහි සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

III. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාවය ලබාගත යුතු ය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

04. වයස් සීමාව

අදාළ නොවේ.

05. වැටුප් පරිමාණය

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව මෙම පත්වීමට හිමි මාසික වැටුප් පරිමාණය රු.47,615/-10x1,335-8x1,630-17x2,170- රු.110,895/- වේ.

06. සම්මුඛ පරීක්ෂණය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පරිපාටිය පදනම් කර ගනු ලැබේ.

CamScanner

| අනු අංකය | සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ප්‍රදානය කරනු ලබන ශීර්ෂ | උපශීර්ෂය යටතේ උපරිම ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01. | සේවා පළපුරුද්ද සඳහා | | 60 |
| | ඉහත අංක 02 ඡේදයේ සඳහන් මූලික සුදුසුකම් සම්පූර්ණ කළ දින සිට අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට තනතුර අනුව බර තැබූ සේවා කාලය පහත පරිදි ගණනය කරනු ලැබේ.<br><br>[ I පෙළ පුනරුත්ථාපන නිලධාරි තනතුරෙහි වසර 06 කට වඩා වැඩි සේවා කාලය ] + 1.2 x [ ප්‍රධාන පුනරුත්ථාපන නිලධාරි තනතුරෙහි සේවා කාලය ]<br><br>ඉහත පරිදි ගණනය කරන ලද ඉහළම බර තැබූ සේවා කාලය හිමි අයදුම්කරුට උපරිම ලකුණු ලබා දී, සෙසු අයදුම්කරුවන්ගේ බර තැබූ සේවා කාලයන්ට ඊට සමානුපාතිකව ලකුණු ලබා දෙනු ලැබේ.<br><br><u>සටහන</u> :- මෙහි 'සේවා කාලය' යන්නෙන් සක්‍රිය හා සතුටුදායක සේවා කාලය අදහස් වේ. | | |
| 02. | කුසලතාවය සඳහා | | 40 |
| | (කුසලතාවය සඳහා ලකුණු ලබා දිය යුත්තේ I පෙළ පුනරුත්ථාපන නිලධාරි තනතුරට පත්වීමෙන් පසුව ලබා ගත් හා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට වලංගු සුදුසුකම් සඳහා පමණි.)<br>**1.** අධ්‍යාපන සුදුසුකම් සඳහා<br>I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනමන උපාධියක් සඳහා - ලකුණු 05<br><br>II. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනමන ඩිප්ලෝමාවක් සඳහා (වසරකට නොඅඩු) - ලකුණු 03<br>(උපරිම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | 05 | |
| | 2. ප්‍රශංසා සඳහා<br>බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් පිරිනමනු ලබන ප්‍රශංසාවක් සඳහා ලකුණු 02<br>• සටහන : ප්‍රශංසා සඳහා ලකුණු දීමට පොදු 230 b ආකෘතිය අනුව තිබිය යුතුය. පොදු 230 b ආකෘතිය මඟින් පිරිනමන ලද ප්‍රශංසා සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 05 | |

| | | |
|---|---|---|
| | 3. ක්‍රීඩා ක්‍රියාකාරකම් සඳහා<br>I. ජාතික කණ්ඩායම් නියෝජනය - ලකුණු 05<br>II. රාජ්‍ය සේවා නියෝජනය - ලකුණු 04<br>III. දෙපාර්තමේන්තු නියෝජනය - ලකුණු 01 | 05 |
| 03. | අනෙක් භාෂා ප්‍රවීණතා සඳහා - සිංහල/දෙමළ/ ඉංග්‍රීසි (මව් භාෂාව හැර)<br>I. රජයේ පුහුණු ආයතනයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් ඩිප්ලෝමාවක් සඳහා - ලකුණු 05<br>(වසරකට නොඅඩු/ පැය 1500 කට නොඅඩු/ NVQ 5)<br>• සටහන : 02.1.(II) සඳහා අදාල කර ගත් ඩිප්ලෝමාව හැර වෙනත් ඩිප්ලෝමාවක් විය යුතුය.<br>II. රජයේ පුහුණු ආයතනයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් සහතිකපත්‍ර පාඨමාලාවක් (වසරකට නොවැඩි හා මාස 06 කට නොඅඩු/ පැය 720කට නොඅඩු/ NVQ 4) - ලකුණු 04<br>III. රජයේ පුහුණු ආයතනයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනමන ලද සහතිකපත්‍ර පාඨමාලාවක් (මාස 06 කට නොවැඩි හා සති 02 කට නොඅඩු/ පැය 360කට නොඅඩු) - ලකුණු 03<br>IV. රජයේ පුහුණු ආයතනයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනමන ලද සහතිකපත්‍ර පාඨමාලාවක් - ලකුණු 02<br>(සති 02 කට නොවැඩි/ පැය 72 කට නොවැඩි) | 05 |
| 04. | පරිගණක සාක්ෂරතාව<br>I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනමන ලද ඩිප්ලෝමාවක් හෝ රජයේ පිළිගත් ආයතනයකින් පිරිනමන ලද NVQ 5 හෝ ඊට ඉහළ සුදුසුකමක් - ලකුණු 05<br>සටහන : 02.1.(II) සඳහා අදාල කර ගත් ඩිප්ලෝමාව හැර වෙනත් ඩිප්ලෝමාවක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.<br>II. රජයේ පිළිගත් ආයතනයකින් පිරිනමන ලද සහතිකපත්‍ර පාඨමාලාවක් (NVQ 4) - ලකුණු 03 | 05 |

CS CamScanner

| | | | |
|---|---|---|---|
| 05. | ආයතනයේ සුභසාධන, ආගමික හා ක්‍රීඩා ආදි සංගමවල දරන ලද තනතුරු හා වගකීම් වෙනුවෙන් (එක් තනතුරක් හෝ වගකීමක් සඳහා ලකුණු 02 බැගින්)<br>• සටහන :- දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නිකුත් කරන ලද ලිපියක් මගින් සනාථ කළ යුතු වේ. | 10 | |
| 06. | පෞරුෂත්වය සහ සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| | මුළු ලකුණු | | 100 |

07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය:

සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය. පසුව ඉදිරිපත් කරනු ලබන ලේඛනවලට ලකුණු ලබා දෙනු නොලැබේ.

සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

(iii) වලංගු රියදුරු බලපත්‍රය

08. අයදුම්පත් ඉදිරිපත් කිරීම:-

i. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට එනම්, 2022-11-14 දිනට ඉහත සුදුසුකම් සපුරා ඇති නිලධරයන් මෙම නිවේදනය අවසානයට දක්වා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව සම්පූර්ණ කර 2022-11-14 දිනට ප්‍රථම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් මා වෙත ලැබෙන සේ ඉදිරිපත් කළ යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

09. සාවද්‍ය තොරතුරු සැපයීම:-

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඕනෑම අවස්ථාවක සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

CamScanner

10. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

11. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

12. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ග තුළ කිසියම් ගැටළුකාරී තත්ත්වයක් ඇතිවුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

2022 ..10.......... මස 05. දින

වසන්තා පෙරේරා
ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

CamScanner

### බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ
### සහකාර බන්ධනාගාර අධිකාරි (පුනරුත්ථාපන) තනතුරට උසස් කිරීම සඳහා
### <u>අයදුම් පත්‍රය - 2022</u>

01. අයදුම්කරුගේ මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) : ..........................................................................................

..........................................................................................................................................

සම්පූර්ණ නම (සිංහලෙන්) : ..........................................................................................................

..........................................................................................................................................

02. ස්ථිර ලිපිනය ..........................................................................................

03. දැනට දරන තනතුර : ..........................................................................................

04. එම තනතුරේ සේවය ස්ථිර කරන ලද දිනය ..........................................................................................

05. කාර්යාලීය ලිපිනය : ..........................................................................................

06. ස්ත්‍රී/ පුරුෂ භාවය : ..........................................................................................

07. උපන් දිනය : ..........................................................................................

2022.11.14 දිනට වයස අවුරුදු .................................. මාස ..........................................

08. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

09. තාක්ෂණික/ වෘත්තිය/ වෙනත් සුදුසුකම් : ..........................................................................................

10. I. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් හෝ දෙපාර්තමේන්තු පරීක්ෂණයකින් දඩුවම් ලබා තිබේ ද? ඔව් / නැත.

II. "ඔව්" නම් විස්තර සඳහන් කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

11. ඔබ සහභාගි වී ඇති බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන න්‍යායාත්මක හා ප්‍රායෝගික වෘත්තිය පුහුණු පාඨමාලා පිළිබඳ විස්තර :

| පුහුණු පාඨමාලාව | කාලය | | ලබා ඇති සාමාර්ථය |
|---|---|---|---|
| | සිට | දක්වා | |
| | | | |
| | | | |
| | | | |

12. පූර්වාසන්න වසර 06 ක් තුළ වැටුප් වර්ධක උපයා ගැනීම සහ පූර්වාසන්න වසර 05 තුළ කුසලතාවය පිළිබඳ විස්තරය :

(කාර්ය සාධන ඇගයීම වාර්තා සඳහා ලබා ඇති කුසලතා මට්ටම - අදාළ කොටුව √ ලකුණ යොදන්න.)

| වර්ෂය | වැටුප් වර්ධක උපයා ගැනීම | | කාර්ය සාධන කුසලතාවය | | | නිවැරදි බවට වි.ලි./ප්‍ර.ලි./පරි.නි.සටහන |
|---|---|---|---|---|---|---|
| | ඇත | නැත | විශිෂ්ඨ | සාමාන්‍යට ඉහළ | සතුටුදායක | |
| 2016 | | | | | | |
| 2017 | | | | | | |
| 2018 | | | | | | |
| 2019 | | | | | | |
| 2020 | | | | | | |
| 2021 | | | | | | |

13. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙම අයදුම්පතේ මා විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි ඇතුළත් කර ඇති තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මගේ අයදුම්පත අවලංගු වීමට යටත් වන බව හා පත්වීම ලැබීමෙන් පසුව එසේ ඔප්පු වුවහොත් පත්වීම අවලංගු වීමට යටත් වන බව දනිමි.

.................................... ........................................................

දිනය අයදුම්කරුගේ අත්සන

CS CamScanner

14. දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය :

අයදුම්කරු, විසින් ඉහත අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති විස්තර සත්‍ය බව, නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව හා සසඳා සොයාබැලූ ලිපි ලේඛන අනුව ඉහත සඳ හා තොරතුරු නිවැරදි බව සහතික කරමි.

...............................

දිනය

...............................

දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ

අත්සන සහ නිල මුද්‍රාව